## බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2010.08.26

වේලාව : පෙ.ව.10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.විමලසේන මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 06. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රුමී මැතිතුමා |
| 07. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 08. ගරු නාගරික මන්ත්‍රී | යූ.එච්. ගාමිණී මැතිතුමා |

**සහභාගීනොවූවෝ:-**

| | |
|---|---|
| 01. ගරු උපසභාපති | සුමේද චාමින්ද බස්නායක මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ආර්.ඩී.නලින් පුෂ්පකුමාර | ලේකම් |

(01) **ආගම සිහිකිරීම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන සභා රැස්වීමට සහභාගීවීමට පැමිණ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා ලේකම් මහතා සාදරයෙන් පිළිගන්නා බව පැවසීය.

බළන්ගොඩ නගරයේ ජීවත්වන බදු ගෙවන ජනතා තෘප්තිමත් වන ආකාරයට ඔවුන්ගේ සුබවිහරණය උදෙසා මෙම සභාව සේවාවන් රැසක් ඉටුකර ඇති බැව් දැන්වීය. එම සේවාවන්හි ඇති විශිෂ්ඨතාව හා ගුණාත්මකභාවය නිසා මෙම සභාව අනෙකුත් පළාත් පාලන ආයතන වලට ආදර්ශයක් වී ඇති අතර , 2006 වර්ෂයේ පළාත් පාලන ආයතන අතර පැවති ජාතික ඵලදායීතා තරගයෙන් දිවයිනෙන්ම ප්‍රථම ස්ථානයත් ,2008 වර්ෂයේ කාර්ය සාධන තරගයෙන් සබරගමුව පළාතෙන් පළමු ස්ථානයත් , ජාතික මට්ටමින් 03 ස්ථානයත් 2009 වර්ෂයේ පළාත් මට්ටමින් පළමු ස්ථානයත් ලබාගනිමින් අභිමානවත් සේවයක් සපයනු ලබන ආයතනයක් බවට පත්ව ඇති බව දැන්වීය.

2006 වර්ෂයේ ජාතික ඵලදායීතා තරගයෙන් පළමු ස්ථානය ලබාගත් මෙම නගර සභාවට 2007 වර්ෂයේ කාර්ය සාධන තරගයෙන් සබරගමුව පළාතෙන් 02 ස්ථාන හිමි වූ බවත්, තරග විනිශ්චයේ දී සිදුකල අසාධාරණයක් මත මෙය සිදුවූ නිසා, 2007 වර්ෂයේ කාර්ය සාධන තරගයට මෙම නගර සභාව ඉදිරිපත් නොවුනු බව දැන්වීය. එම වර්ෂයේ දී ජාතික මට්මේ තරගයෙන් සබරගමුව පළාත් සභාවට කුසලතා සහතිකයක් හෝ හිමිකරගැනීමට නොහැකි වූ

බව සදහන් කරන ලදී. බළන්ගොඩ නගර සභාව සබරගමුව පළාත් සභාවට කීර්තියක් ගෙනදෙන ආයතනයක් ලෙස පිළිගෙන ඇති අතර , විශේෂයෙන් සබරගමුව පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමන් මෙම සභාව කෙරෙහි විශාල පැහැදීමකින් සිටින නිසා එතුමා අපගේ කාර්යයන් සාර්ථක කරගැනීමට අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන ලබාදෙමින් සභාවේ කටයුතු සාර්ථක කරගැනීමට සහයෝගය දක්වනු ලබන බැවින් ඒ සම්බන්ධව මෙම නගර සභාවේ ගෞරවය හා ප්‍රශංසාව එතුමන් වෙත පළකරන බැව් දැන්වීය.

බළන්ගොඩ නගර සභාව වෙත පවරාගන්නා ලද තානායම අළුත්වැඩියා කර 2010.08.10 වන දින උත්සවාකාරයෙන් ජනතා අයිතියට පත්කල අතර , 2009 වර්ෂයේ කාර්ය සාධන තරගයෙන් ජයග්‍රහණය කල ආයතන වෙත ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය කිරීමේ උත්සවයද එදින ගෝල්ඩන් සන්සිට් උත්සව ශාලාවේ දී පැවැත් වු අතර , එම උත්සවයන් ඉතා සාර්ථකව නිමකිරීමට හැකි වු බැවින් , ඒ සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීතුමන්ලාටත් , ලේකම්තුමා ඇතුළ කාර්ය මණ්ඩලයේ සියළු දෙනාටම සිය ස්තුතිතිය පිරිනමන බැව් දැන්වීය.

බළන්ගොඩ නගර සභාව හමුවේ පැවති ප්‍රධානතම අභියෝගය වුයේ කැළි කසළ කළමනාකරණය කරගැනීමට නොහැකිවීමයි. නමුත් එම අභියෝගය ජයගැනීමට මෙම සභාවට හැකි වු අතර , මේවන විට ඉතා හොඳ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භකර විශාල ආදායමක් ලබාගැනීමට කටයුතු කර ඇති බැව් පැවසීය.

එසේම බළන්ගොඩ තානායම ද ආගන්තුකයින්ට හොඳ නවාතැන්පලක් සපයනවාත් සමගම ආදායම් උත්පාදක ව්‍යාපෘතියක් බවට පත්කිරීමට ක්‍රියාකරන බවත් , අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ද සංචාරක ක්ෂේත්‍රය නගා සිටුවීමට විශේෂ වැඩ සටහන් රැසක් ක්‍රියාවට නංවා ඇති බව සඳහන් කරමින් , සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## (03) 2010.07.29 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:

පසුගිය සභා වාර්තාවේ තීරණ අංක: 05:45 යටතේ සදහන්ව ඇති යෝජනා වලට " කිරිමැටිතැන්න ටකරන් කඩය අසල ජල රක්ෂිතය" ද ඇතුළත් විය යුතු බවත් සභා වාර්තාවේ 32 වන පිටුවේ " ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න යන මන්ත්‍රීතුමන්ලා දෙදෙනා විසින් තානායම සදහා කොපමණ මුදලක් වැය වී ඇත්දැයි ප්‍රශ්න කරන ලදී" යනුවෙන් සඳහන්ව ඇති බවත් , එය " ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න යන මන්ත්‍රීතුමන්ලා තිදෙනා විසින් තානායම සදහා කොපමණ මුදලක් වැය වී ඇත්දැයි ප්‍රශ්න කරන ලදී." යනුවෙන් සංශෝධනය විය යුතු බවත් ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් පැවසීය.

ඉහත සඳහන් සංශෝධනයන්ට යටත්ව 2010.07.29 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

## (04) පසුගිය සභා වාර්තාව සමාලෝචනය කිරීම:

පසුගිය සභා රැස්වීමේ දී වැලිහරනාව මාර්ග හා චෙට්නෝල් මාර්ගයේ වලවල් සෑදී ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බවත් , ශෛලතලාරාම මාර්ගයේ දෙපස කාණු ගොඩවී ඇති බවත් ප්‍රකාශ කල අතර , ඒ සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේදැයි ගරු නාගරික මන්ත්‍රී , ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විමසීය.

වැලිහරනාව මාර්ගය සකස් කිරීම සඳහා ප්‍රදේශවාසී දැනුවත් කර ශ්‍රමදානයක් සංවිධානය කරන ලෙසත් , ඒ සදහා සභාව සතු ජේ.සී.බී.යන්ත්‍රය ලබාදීමට කටයුතු කල හැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැන්වීය.

05. **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

05:01 **අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේ දී ලොතරැයි අලෙවිකුටි ඉවත් නොකිරීමට කටයුතු කිරීම**

උක්ත කරුණට අදාළව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් එවා ඇති 2010.08.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මාර්ග සංවර්ධන අධිකාරිය , නාගරික සංවර්ධන අධිකාරිය , පොලීසිය සහ ඇතැම් පළාත් පාලන ආයතනයන් අනවසර ඉදිකිරීම් ඉවත් කරන අවස්ථාවේ නගර හා මංසන්ධි වල ඉදිකර ඇති ලොතරැයි අලෙවි කුටිද ඉවත් කිරීමට කටයුතු කිරීම නිසා ලොතරැයි අලෙවිය පවත්වාගෙන යාමේ අසීරු තත්ත්වයකට පත් වී ඇති අතර , මේ හේතුව නිසා ජාතික ලොතරැයි මණ්ඩලයට ලැබෙන ආදායම් ප්‍රමාණය අඩු වී ඇති බැවින් , ලොතරැයි අලෙවි කුටි ඉවත් නොකරන ලෙස අතිගරු ජනාධිපතිතුමන් විසින් උපදෙස් ලබාදී ඇති හෙයින් , ඒ අනුව අවශ්‍ය කටයුතු කරන ලෙස එමගින් දන්වා තිබිණ.

මෙම නගර සභාව කිසිවිටෙකත් ලොතරැයි අලෙවි කුටි ඉවත්කිරීමට කටයුතු කර නොමැති බවත්, මෙම කාර්යය මාර්ග සංවර්ධන අධිකාරිය හා පොලීසිය විසින් කරනු ලබන්නක් බැව් දැණුම්දීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:02 **ණය පහසුකම්මත ඉන්ධන ලබාගැනීම:**

බළන්ගොඩ නගර සභාවේ වාහන සඳහා ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය මගින් ණය පදනම මත ඉන්ධන ලබාගැනීම සිදුකරනු ලබන අතර , ඒ සඳහා දැනට රු.260000/- ක මුදලක් තැන්පත් කර ඇති අතර , මසකට ලක්ෂ 03 ඉක්මවා ඉන්ධන ලබාගැනීම සිදුකරනු ලබන බැවින් , තවත් රු.100000/- ක මුදලක් තැන්පත් කිරීම සුදුසු බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

තවත් රු.90000/- ක අත්තිකාරමක් ලබාදීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:03 **පොදු වෙළඳසැල කඩ කාමර 2010 වර්ෂය සඳහා තක්සේරු කරගැනීම:**

ඉහත සඳහන් කරුණට අදාළව සබරගමුව පළාත් තක්සේරුකරු විසින් එවා ඇති 2010.08.12 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බළන්ගොඩ නගර සභාව සතු පොදු වෙළඳසැල කඩ කාමරවල වර්තමාන මාසික ආර්ථික කුලිය පහත සඳහන් පරිදි තක්සේරු කරන බවත් , අදාළ දේපළ යථා තත්ත්වයෙන් පවත්වාගෙන යෑම , අළුත්වැඩියා කිරීම හා වරිපනම් ගෙවීම යන කාරණා පදනම් කරගෙන මෙම තක්සේරුව සිදුකර ඇති අතර , මෙය ඉදිරි වර්ෂ 03 ක් සඳහා බලපැවැත්වෙන බැව් එමගින් අවධාරණය කර තිබුණ.

- **පොදු වෙළඳසැල කඩ කාමර**

| අනු අංකය | කඩ කාමර අංකය | මාසික ආර්ථික කුලිය |
|---|---|---|
| 01 | 01 | රු. 5000.00 |
| 02 | 02 | 5000.00 |
| 03 | 03 | 5000.00 |
| 04 | 04 | 5000.00 |
| 05 | 05 | 7500.00 |
| 06 | 06 | 5000.00 |
| 07 | 07 | 5000.00 |

බළන්ගොඩ නගර සභාව

| | | |
|---|---|---|
| 08 | 08 | 5000.00 |
| 09 | 09 | 5000.00 |
| 10 | 10 | 5000.00 |
| 11 | 11 | 5000.00 |
| 12 | 12 | 5000.00 |
| 13 | 13 | 5000.00 |
| 14 | 14 | 5000.00 |
| 15 | 18/19 | 9000.00 |

- **සාප්පු කඩ කාමර**

| **අනු අංකය** | **කඩ කාමර අංකය** | **මාසික ආර්ථික කුළිය** |
|---|---|---|
| 01 | 01 | රු. 16000.00 |
| 02 | 02 | 15000.00 |
| 03 | 03 | 15000.00 |
| 04 | 04 | 15000.00 |
| 05 | 05 | 15000.00 |
| 06 | 06 | 15000.00 |
| 07 | 07 | 15000.00 |

පොදු වෙළඳ සැල සාප්පු කඩ කාමර හිමියන් කැඳවා සාකච්ඡා කිරීමටත් , අනෙකුත් කඩ කාමර සඳහා අදාළ තක්සේරුව ක්‍රියාත්මක කිරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:04 **<u>ළමා අංශය සඳහා අවශ්‍ය උපකරණ හා පොත්පත් ලබාගැනීම:</u>**

බළන්ගොඩ මහජන පුස්තකාලයේ ළමා අංශය සඳහා අවශ්‍ය පහත සඳහන් උපකරණ හා පොත්පත් ලබාදෙන ලෙස ඉල්ලමින් පුස්තකාලයාධිපති විසින් එවා ඇති 2010.08.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

01. ළමා කියවීම් මේස (වර්ණ ගන්වන ලද) - රවුම් කියවීම් මේස 02 - ලී

02. ළමා කියවීම් මේස - හතරැස් 08(වර්ණ ගන්වන ලද )
03. ළමා පුටු - ප්ලාස්ටික් පුටු 10
04. ළමා පුටු - ලී 10 ( වර්ණ ගන්වන ලද )
05. පොත් රාක්ක 04
06. බිත්තියේ සවිකිරීම සඳහා දැන්වීම් පුවරු.
07. වයිට් බෝඩ් 01
08. ලෝක ගෝලයක්
09. ලෝක සිතියමක්/ලංකා සිතියමක්
10. ළමා පොත්
    1. ඓතිහාසික නව කථා
    2. යොවුන් නව කථා
    3. වීරකතා
    4. චරිත කථා
    5. විද්‍යා ප්‍රබන්ධ
    6. සුරංගනා කථා
    7. ජනකතා
    8. කවි

9. ලොකු අකුරින් මුද්‍රිත ළමා කථාපොත්
10. ළමා කථා
11. ළමා පත්තර
12. Pamplet Boyes
13. ගෘහාශ්‍රිත ක්‍රීඩාභාණ්ඩ
14. ඔවදන් වැකි සදහන් චිත්‍ර සහිත පුවරු

ළමා අංශය සඳහා අවශ්‍ය භාණ්ඩ හා පොත්පත් ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:05 **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ( ICT ) පුහුණු පාඨමාලාව**

ඉහත සදහන් කරුණට අදාළව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයෙ අධ්‍යක්ෂ ජනරාල් විසින් එවා ඇති 2010.07.06 දිනැති ලිපිය සභාගත කරන ලදී.

වර්තමානයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීම තුළින් පුස්තකාලවල බොහෝ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ලබාදීමට සමත්ව ඇති අතර , තවදුරටත් පුස්තකාල සේවා විධිමත් කිරීමේ අරමුණින් පුස්තකාල ස්වංක්‍රීයකරණය පිළිබඳ පාඨමාලා පැවැත්වීමට පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු කර ඇත.

ඒ සඳහා පුස්තකාලයාධිපති/පුස්තකාල භාර නිලධාරීන්/පුස්තකාල සහයකයින් හෝ පුස්තකාල කටයුතු වලට අදාළ වෙනත් නිලධාරී හට මේ සඳහා සහභාගී විය හැකි අතර , එක්

පාඨමාලාලාභියෙගෙන් රු.3500/- ක සහනදායී පාඨමාලා ගාස්තුවක් කරනු ලබන බැව් එමගින් සදහන් කර තිබුණි.

අදාල චක්‍රලේඛය උපදෙස් පරිදි සභා අරමුදලින් 1/2 ක් වැයකර පුස්තකාල සහයිකා රත්නසීලි මහත්මිය මෙම වැඩ සටහනට සහභාගීකරවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:06 **නව ගිණුමක් ආරම්භ කිරීම**

සබරගමුව පළාත් පාලන දෙපාර්තමේන්තුව ගිණුම් කටයුතු පවත්වාගෙන යනු ලබන්නේ ලංකා බැංකුව සමග බැවින් , පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මෙම නගර සභාවට කරනු ලබන ගෙවීම් වලදී නගර සභා අරමුදල පවත්වාගෙන යන මහජන බැංකුවට ලැබීමට යම් ප්‍රමාදයක් පවතින බැවින් , ගෙවීම් කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා දැනට සභා අරමුදල පවත්වාගෙන යන මහජන බැංකුවේ අංකඃ 017-1-001-6351750 ගිණුම වෙනුවට ලංකා බැංකුවේ නව ගිණුමක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදෙන ලෙස ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසිාන් ස්ථිර කරන ලදී. මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:07 **තානායම සඳහා පරිගණක ලබාගැනීමඃ**

බළන්ගොඩ නගර සභාව මගින් පවත්වාගෙන යන තානායම සඳහා පරිගණක පහසුකම් හා අන්තර්ජාල සම්බන්ධතාව ලබාගැනීම සුදුසු බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මිළ ගණන් කැඳවා මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:08 **විදුණැන පියස මධ්‍යස්ථානය සඳහා මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරයක් හා තිරයක් ලබාගැනීම**

විදුණැන පියස මධ්‍යස්ථානය මගින් සිදුකරන වැඩ සටහන් සඳහා භාවිතයට ගැනීමට මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරයක් හා ස්ටැන්ඩ් එකක් සහිත තිරයක් ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මිළ ගණන් කැඳවා මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:09 **වැලි සැපයීම:**

බළන්ගොඩ නගර සභාව සඳහා 2010 වර්ෂයට වැලි ( වැලි කියුබ් එකක් ප්‍රවාහනය ද මග රු.4750/- ක මුදලකට ) සැපයිය හැකි බව දන්වමින් ජේ.එම්.එම්.ජයලත් බණ්ඩාර මහතා විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙම දිනවල අධික වැලි හිඟයක් පවතින හෙයින් , කර්මාන්තවල වැඩ කටයුතු ඉටුකරගැනීමේ ගැටළුවක් පවතින බැවින් , ඉහත සඳහන් අයගෙන් ද වැලි ලබා ගැනීම සුදුසු යැයි ගරු සභාපතිතුමන් විසින් දැන්වීය.

මිළ ගණන් කැඳවා මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

5:10 **බස්නැවතුම්පළ වැසිකිළි පද්ධතිය සඳහා අලුතින් උරා ගැනීමේ වළක් සකස්කිරීම:**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කරඇති ලිපියක් සභාගත කරන ලදී.

බස්නැවතුම්පළ පිරිමි පොදු වැසිකිළිය නිරන්තරයෙන් උතුරා යාම නිසා උග්‍ර පාරිසරික හානියක් සිදුවන අතර ඒ සඳහා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන අතර ,මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නගර සභා අරමුදලින් දැරිය යුතුවේ. ,මේ සඳහා දැනට ව්‍යාපෘති කිහිපයක් සකස් කර තිබුණ ද ඒ සඳහා අවශ්‍ය අනුමැතිය මෙතෙක් ලැබී නොමැති. කෙසේ වෙතත් මෙම ගැටළුව විසඳිය යුතු බැවින් , හදිසි අත්‍යාවශ්‍ය සහ කඩිනමින් කටයුතු කාර්යයක් සේ සලකා මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙමගින් පෙන්වා දී තිබුණි.

01. පූතික ටැංකියක් සකස් කිරීම
02. ජල පිල්ටරයක් සකස් කිරීම
03. උරා ගැනීමේ පද්ධතියක් සකස් කිරීම.

සභා අරමුදල් යොදා අවශ්‍ය ඉදිකිරීම් සිදුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:11 **ජල බිල්පත පියවීම - නගර සභා පොදු වෙළඳසැල**

බළන්ගොඩ නගර සභා පොදු වෙළඳපල සඳහා රු.5002.10 ක හිඟ ජල ගාස්තුවක් මුදලක් ගෙවීමට ඇති බැවින් , එම මුදල ගෙවන ලෙසත් , අදාල මුදල මුදල නොගෙවුවහොත් , ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 87 (7) වගන්තිය යටතේ එම මුදල අයකරගැනීම සඳහා නීතිමය පියවර ගන්නා බව දන්වමින් , ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

සභා අරමුදලින් හිග මුදල ගෙවීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

05:12 **ඇපතැන්පත් ආපසු ලබාගැනීම:**

බළන්ගොඩ පොදු වෙළඳසැලේ අංක:09/10 දරණ මාළු කඩ 2010 වර්ෂය සඳහා ටෙන්ඩර් ලබාගැනීම සඳහා ලංසුපත් ඉදිරිපත් කල අතර ,එය ලබාගැනීමට නොහැකි වූ නිසා සභාවේ තැන්පත් කරන ලද ටෙන්ඩර් ඇප මුදල හා පෝරම ගාස්තු ආපසු ලබාදෙන ලෙස ඉල්ලමින් , බළන්ගොඩ, බලගහමුල, අංක:307 දරණ ලිපිනයේ පදිංචි ජී.ඩබ්.සමන්තුෂාර මහතා විසින් එවා ඇති 2010.08.05 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙම කඩ කාමර සඳහා අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බැවින් , එම නීතිමය කටයුත්ත අවසන් වූ පසුව අදාළ තැන්පත් මුදල් ආපසු ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:13 **ඩෙංගු මර්ධන වැඩ සටහන වෙනුවෙන් නගරයේ ප්‍රධාන කාණු කිහිපයක් සකස් කිරීම:**

පසුගියදා ඩෙංගු මර්ධන වැඩ සටහන සඳහා නගරය පවිත්‍රකිරීමේ දී කඩිනමින් අලුත්වැඩියා කල යුතු කාණු කිහිපයක් නිරීක්ෂණය වු අතර , එම කාණු සකස් කිරීම අත්‍යාවශ්‍ය බව දන්වමින් ඉදිරිපත් කර ඇති 2010.08.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

01. නව ලංකා හෝටලය පිටුපස සිට කෝයා ග්‍රොසරිය දක්වා කණුව බිම කොන්ක්‍රීට් කර දෙපැත්ත බැම් දැමීම.
02. දෙවට පාර ප්‍රධාන කාණුව දොරවෙල ඔය දක්වා කොන්ක්‍රීට් කිරීම.

කඩහිමියන්ට අදාළ කොටස් ඔවුන් ලවා ඉදිකිරීමටත් , හරස් කාණුව සභාව මගින් ඉදිකිරීමටත් අනුමැතිය ලබාදෙන ලදී.

05:14 **වරිපනම් නිදහස් කිරීම - කල්තොට පාර අංකඃ 08**

බළන්ගොඩ කල්තොට පාරේ අංකඃ 08 දරණ ස්ථානයේ පවත්වාගෙන ගිය ව්‍යාපාර 2009 වර්ෂයේ ජනවාරි සිට වසා දමා ඇති බැවින් , එම ගොඩනැගිල්ල සඳහා අයකරන ලද වරිපනම් නිදහස් කරන ලෙස ඉල්ලමින් , බළන්ගොඩ , බලගහමුල, කල්තොට පාර , අංකඃ 08 දරණ ලිපිනයේ පදිංචි ජී.ඩබ්.නෙල්සන් සිල්වා මහතා විසින් එවා ඇති 2010.06.06 දිනැති ලිපිය සභාගත කරන ලදී.

2010 වර්ෂයේ කාර්තු දෙකක් සඳහා 50% කින් වරිපනම් නිදහස් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:15 **වැසිකිළි ආධාර ලබාදීම**

2009 වර්ෂය වෙනුවෙන් වැසිකිළි ආධාර ලබාදීමට රු.100000/- ක මුදලක් වෙන්කර තිබුණු අතර , එම මුදලින් ආධාර ලබාදීමට කටයුතු කිරීමේ දී පහත සඳහන් කොන්දේසි වලට යටත්ව ආධාර ලබාදීම සිදුකල යුතු බව පළාත් පාලන කොමසාරිස් විසින් දන්වා අතර , එම කොන්දේසි වලට යටත්ව ආධාර ලබාදීම සුදුසු බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

**කොන්දේසි :-**

01. අඩු ආදායම්ලාභීන් බවට ග්‍රාම නිලධාරි හා ප්‍රාදේශීය ලේකම් සහතික කල යුතුය.
02. ජල මුද්‍රිත වැසිකිළියක් නොතිබිය යුතුය.
03. මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ලබාදුන් සැලැස්මට ඉදිකල යුතුය.
04. ආධාර ලබාදිය හැකි උපරිම මුදල රු.5000/- කි.
05. ආධාර ලබාදීමට පෙර වල කපා අවසන් කර අවශ්‍ය ද්‍රව්‍ය ලබාගෙන තිබිය යුතුය.
06. ආධාර මුදල ගෙන දින 30 ක් තුළ වැඩ අවසන් කර නගර සභාවට දැණුම් දිය යුතුය.
07. දින 30 කින් සම්පූර්ණ නොකරන අයට විරුද්ධව අධිකරණයේ නඩු පවරනු ලැබේ.

**තෝරාගනු ලැබූ ආධාරලාභීන් :-**

| අනු අංකය | නම | ලිපිනය |
|---|---|---|
| 01 | ඇපලේගම ඇතිගේ ගුණරත්න මැණිකේ | කෝපිවත්ත, තුඹගොඩ,බළන්ගොඩ |
| 02 | එම්.ජී.හීන්මැණිකේ | 964, මෙගොඩ කිරිඳිගල,සියඹලාගහවත්ත |
| 03 | උඩවත්තගේ සුවිනීතා | වැකුඹුර,කොටුගොඩැල්ල,බළන්ගොඩ |
| 04 | එච්.එම්.මහින්ද | පන්සල යට පාර,ඕළුගන්තොට,බළන්ගොඩ |
| 05 | සින්නයියා වසුමදී | අංකඃ 22 නගර සභා නිවාස, පෙට්ටිගල පාර, බළන්ගොඩ |
| 06 | උදය ශාන්ත කුමාර | නො.36, කරදියමුල්ල පාර, ඕළුගන්තොට, |

| | | |
|---|---|---|
| | | බළන්ගොඩ |
| 07 | ඩබ්.ඒ.ඥාණවතී | නොඃ40 කරදියමුල්ල පාර, ඕළුගන්තොට,බළන්ගොඩ |
| 08 | විතානගේ උපාලී මුණසිංහ | නො.377,ඕළුගන්තොට,බළන්ගොඩ |
| 09 | පෙරුමාල් නීලමෙගන් | වැව්වත්ත,බළන්ගොඩ |
| 10 | එම්.එම්.ෆාරුක් | ඒ.10,පෆීල් හජ්ජියාර් මාවත, බළන්ගොඩ |
| 11 | කෝන්ගොල්ලේ සුභද්‍රා | ගල්වල පාර, උඩකන්ද ,බළන්ගොඩ |
| 12 | රුවන්කුට්ටියලාගේ නීටා | 75/4, රාස්සගල පාර,බළන්ගොඩ |
| 13 | ඒ.පියරත්න | 61/1 රාස්සගල පාර,බළන්ගොඩ |
| 14 | මොහොමඩ් තාහීර් කන්සුල් හිදායා | 306/7,මිරිස්වත්ත,බළන්ගොඩ. |

ඉහත සඳහන් කොන්දේසි වලට යටත්ව මෙම ආධාරලාභීන් වෙත වැසිකිළි ආධාර ලබාදීමට ගරු සභාපතිතුමන් විසින් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:16 **පළාත් පාලන සතිය - 2010**

" කාර්යක්ෂම පළාත් පාලන සේවා තුළින් සුභ අනාගතයක් " යන තේමාව යටතේ ක්‍රියාත්මක කරනු ලබන පළාත් පාලන සතිය වැඩ සටහනෙහි සුවිශේෂී අවස්ථාවන් සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමන් වෙත ආරාධනා කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලමින් පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති සීඑල්ජී/561/2010 හා 2010.07.08 දිනැති ලිපිය ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

05:17 **ටෙන්ඩර් ඇප මුදල් ආපසු ලබාගැනීමඃ**

2010 වර්ෂයට බළන්ගොඩ නගර සභා පොදුවෙළඳසැලෙහි අංකඃ 09,10 කඩ කාමර ටෙන්ඩර් ලබාගැනීම සඳහා සභාවේ තැන්පත් කරන ලද ටෙන්ඩර් ඇප මුදල් හා පෝරම ගාස්තු ආපසු ලබාදෙන ලෙස ඉල්ලමින් , බළන්ගොඩ, බලගහමුල,අංකඃ 307, දරණ ලිපිනයේ පදිංචි ජී.ඩබ්.සිරිපාල ද සිල්වා මහතා විසින් එවා ඇති ඇති 2010.08.05 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙම කඩ කාමර සඳහා නඩුවක් පවතින බැවින් , එහි කටයුතු අවසන් වු අදාල ඇප මුදල් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:18 **ජනතා සත්කාර ජංගම සේවය - රත්නපුර දිස්ත්‍රික්කය**
**2010 සැප්තැම්බර් මස 18 හා 19 දෙදින**

ඉහත සඳහන් කරුණට අදාළව රත්නපුර දිස්ත්‍රික් ලේකම් විසින් එවා ඇති 2010.08.05 දිනැති ලිපිය සභාගත කරන ලදී.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ගරු අමාත්‍ය ඩබ්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2010.08.02 වන දින පැවති රැස්වීමට මෙම ආයතනය නියෝජනය කරමින් නිලධාරියෙකු සහභාගී නොවීම නිසා මහජනතාවගේ නොවිසඳුනු ගැටළු විසඳීම පිළිබඳව ප්‍රගතිය ලබාගැනීමට නොහැකි වු බැවින් , ඒ සම්බන්ධව මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඒ සම්බන්ධයෙන් පවතින ගැටළු නොපමාව දන්වා එවන ලෙස එමගින් දන්වා තිබිණ.

අදාළ ගැටළු විසඳීම සඳහා එම ආයතයන් වෙත යොමුකල බව දැණුම් දීමට තීරණය කරන ලදී.

05:19 **නිවාඩු අනුමත කිරීම :**

හදිසි අසනීප තත්ත්වයක් හේතුවෙන් අද දින පැවැත්වෙන මහා සභා රැස්වීමට සහභාගීවිය නොහැකි බව දන්වමින් , ගරු උපසභාපති, සුමේද චමින්ද බස්නායක මැතිතුමා විසින් එවා ඇති විදුලි පණිවුඩයක් සභාගත කරන ලදී.

නිවාඩු අනුමත කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

05:20 **බළන්ගොඩ කාර්පාක් අංකඃ 06 කඩ කාමරය පිළිබඳවයි**

ඉහත සඳහන් කරුණට අදාළව සබරගමුව පළාත් සභාවේ ගරු සෞඛ්‍ය ,දේශීය වෛද්‍ය සහ වනිතා කටයුතු අමාත්‍යතුමා විසින් එවන ලද අංකඃපසප/පා/පා/කො/29 හා 2010.07.28 දිනැති ලිපිය අනුව බළන්ගොඩ , කිරිඳිගල , අනඳමෙත්ගම ඩබ්.එල්.ආනන්ද මහතා වෙත පොලේ ඇති කඩ කාමර වලින් හෝ කඩ කාමරයක් ලබාදීමට හැකියාවක් තිබේ නම් , එය ලබාදීමට කටයුතු කරන ලෙස දන්වමින් සබරගමුව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති අංකඃ සීඑල්ජී/6117 හා 2010.07.29 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පොලේ මෙවැනි කඩ කාමරයක් නොමැති අතර , අංකඃ 06 දරණ කඩ කාමරය නැවත ටෙන්ඩර් කරනු ලබන බැවින් ඒ සඳහා ඉල්ලුම් කල හැකි බව දැණුම්දීමට සභාව අනුමත කරන ලදී.

05:21 **අ.ත.ක.ස.-රත්නපුර දිසා සංවිධානයේ 18 වන සංවත්සර උළෙල**

අගනුවර තරුණ කවි සමාජයේ සංවත්සර උළෙල මෙවර බළන්ගොඩ නගරය මුල්කොටගෙන පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින් , මෙම කාව්‍ය සාහිත්‍ය උළෙල සඳහා අනුග්‍රහය ලබාදෙන ලෙස ඉල්ලමින් අ.ත.ක.ස.මාධ්‍ය ලේකම් විසින් එවා ඇති 2010.08.03 දිනැති ලිපිය සභාගත කරන ලදී.

අවශ්‍ය සහයෝගයන් ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:22 **බළන්ගොඩ නගරයේ දූෂණ සම්බන්ධයෙනි**

උක්ත කරුණට අදාළව රත්නපුර සහකාර පොලිස් අධිකාරී අමතමින් මෙම නගර සභාවේ ගරු සභාපතිතුමාට ද පිටපත් සහිත ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

එමගින් පහත සඳහන් කරුණු අවධානයට යොමුකර කර තිබුණු අතර , මේ සම්බන්ධව සොයා බලා නිසි පියවර ගන්නා ලෙස එමගින් ඉල්ලා තිබිණ.

01. කාන්තාවන් ඉරිදා පොලේ දී තරුණයන්ගේ නොමනා උසුළු විසුළු වලට ලක්වීම, විකිණීමට තිබෙන භාණ්ඩ වලින් දමාගැසීම නිසා දැඩි අපහසුතාවයට පත්වීම.
02. බළන්ගොඩ බස්නැවතුම්පලේ පොදු වැසිකිළිය තුළ නොමනා ක්‍රියාකාරකම් සිදුවීම.
03. බස්නැවතුම්පළ තුළ අනවශ්‍ය ලෙස පාසල් යන වයසේ ළමයින් හා තරුණයන් ගැවසීම මගීන්ට හා වෙළෙන්දන්ට හිරිහැරයක්වීම.
04. පොළේ වෙළඳුන් බීමතින් වෙළදාම් සිදුකිරීම නිසා පාරිභෝගිකයන් දැඩි අපහසුතාවකට ලක්වීම.
05. බළන්ගොඩ බස් නැවතුම්පලේ අශිලාචාර ලෙස හැසිරීම සම්බන්ධයෙන් නිහඬ පිළිවෙතක් පොලීසිය විසින් අනුගමනය කිරීම.
06. මේ වන විට නගරය පුරා බීමතින් පුද්ගලයින් හැසිරීම හා පොදු ස්ථානවල දුම්පානය සිදුකිරීම නිසා මහජනතාව දැඩි අපහසුතාවයකට පත්ව තිබේ.
07. බදුල්ල බස් නවත්වනු ලබන තුඹගොඩ හා ඇල්ලෙඅරාව හන්දියේ ගංජා හා අනෙකුත් මත්ද්‍රව්‍ය විකිණීම.

පොලීසියට අදාළ කාර්යයන් ඉටුකරන ලෙස දැණුම්දීමටත් , මෙම සභාව මගින් ඉටුකළ යුතු කාර්යයන් සභාව මගින් ඉටුකිරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

5:23 **වැලිහරනාව පාරේ කැඩී ඇති ස්ථානයක් අලුත්වැඩියා කිරීම:**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ , කිරිදිගල , වැලිහරනාව පාර , " සේරානි " යන ලිපිනයේ පදිංචි කේ.එස්.නෙරතල්දෙණිය මහතා විසින් එවා ඇති 2010.08.20 දිනැති ලිපිය සභාගත කරන ලදී.

වැලිහරනාව ඇලට යාබඳ කොටසේ මාර්ගය කැඩී ඇති බැවින් , මාර්ගය පටුවී ඇති නිසා වාහන අනතුරු සිදුවීමට ඉඩ ඇති බැවින් , එම කොටස සකස්කරදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණි.

ශ්‍රමදානයක් මගින් මෙය සකස්කරදීම සුදුසු බවත් , ඒ සඳහා දිනයක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කිරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:24 **ඕළුගන්තොට රෝහල අසල වලවේ ගං ඉවුර අපවිත්‍ර කිරීම:**

බළන්ගොඩ ඕළුගන්තොට රජයේ මුළික රෝහලට සමාන්තරව බදුල්ල මාර්ගයේ දැනට මාසයකට පමණ සිට ආරම්භකර ඇති අනවසර පළතුරු ආදී වෙළඳසැල නිසා වලවේ ගඟද අපවිත්‍ර වීම සිදුවන අතර , තැඹිලි කෝම්බ,කුරුම්බා කෝම්බ,පොලිතීන් මළු යනාදී සියල්ලක්ම පරිසරයට දැමීම නිසා පරිසරය අපවිත්‍රවන බවත්, මේ සම්බන්ධව අදාල බලධාරීන්ගේ අවධානය යොමුකල ද ඒ කෙරෙහි කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැති බව දන්වමින් , සබරගමුව පළාත් ගරු පාරිසරික අමාත්‍යතුමන් අමතමින් මෙම සභාවේ ගරු සභාපතිතුමාට ද පිටපත් සහිතව යොමු කර ඇති 2010.08.17 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මීට අදාළව බළන්ගොඩ , ඕළුගන්තොට , පන්සල අසල පාර යන ලිපිනයේ පදිංචි ජී.කේ.වසන්ත සංජීව යන අය විසින් එවා ඇති ලිපියක් ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ඕළුගන්තොට,පන්සල අසල තාවකාලිකව පළතුරු වෙළඳසැලක් පවත්වාගෙන යන අතර , මෙමගින් පරිසර දූෂණයක් හෝ වෙනත් කිසිදු අවහිරතාවයක් සිදුනොවන බවත්, තමන් නාවික හමුදාවේ සේවයේ යෙදී සිටිය දී වෙඩි වැද අනතුරකට පත්වීම නිසා වසර 12 ක් සේවයෙන් ඉවත් වී රැකියාවක් නොමැතිව අසරණ සිටි අතර , දෙමාපියන් ,බිරිඳ හා දරුවන් රැකබලාගැනීම අසීරු බැවින් , ඉහත සඳහන් ස්ථානයේ පළතුරු වෙළඳසැලක් පවත්වාගෙන යාමට කටයුතු කල බැවින් , මෙම තාවකාලික ලෑලී කඩය විධිමත් සැලසුමකට අනුව සකස් කරගැනීමට අවසර ලබාදෙන ලෙස ඉල්ලා තිබිණ.

ඉහත සඳහන් කරුණු සලකා බැලූ සභාව , විධිමත් ආකාරයට මෙය පවත්වාගෙන යන ලෙස උපදෙස් ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:25 **අනවසරයෙන් මාර්ගය දෙපස මාළු අලෙවිකිරීම:**

බළන්ගොඩ නගර සීමාවේ අනවසරයෙන් මාළු අලෙවි කිරීම සිදුනොකරන ලෙස අදාළ අය වෙත උපදෙස් ලබාදුන්න ද දිගින් දිගටම අනවසරයෙන් මාළු වෙළඳාම සිදුකරන බැව් දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සම්බන්ධව පොලිස් ස්ථානය වෙත දැණුම්දීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:26 **බදු සංශෝධනය කිරීම:**

බළන්ගොඩ , බස්නැවතුම්පල අංක: 12 ඩී දරණ කඩ කාමරයේ බදුකරු විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඉහත සඳහන් කඩ කාමරයෙන් ප්‍රමාණවත් ආදායමක් නොලැබෙන බැවින් තව දුරටත් මෙම කඩ කාමරය පවත්වාගෙන යාමට නොහැකි බැව් දන්වා තිබිණ.

මෙම ව්‍යාපාරය පවත්වාගෙන යාමට නොහැකි බැව් දන්වා ඇති බැවින් , කඩ කාමරය සභාවට පවරාගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:27 <u>226 - 7521 දරණ ටිපර් රථයට ටයර් දැමීම:</u>**

226-7521 දරණ ටිපර් රථයට ටයර් දැමීම අවශ්‍ය බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මිළ ගණන් කැඳවා ලබාගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:28 <u>ඔප්පු සහිත ඉඩමක ගොඩනැගිලි සැලසුම ඉදිරිපත් කර වසර 04 කට පසුව ගොඩනැගිල්ල ඉදිකිරීමේ දී නගර සභාව විසින් කඩා කප්පල් කර පාඩු සිදුවීම:</u>**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ , බලගහමුල,අංක:307 දරණ ලිපිනයේ පදිංචි අනුර එදිරිවීර ජයසේකර මහතා විසින් එවා ඇති 2010.08.24 වන දිනැති ලිපිය සභාගත කරන ලදී.

එම ලිපියේ සඳහන් කරුණු වලට අනුව , මෙහි සඳහන් වන ගොඩනැගිල්ල ඔහුගේ බිරිඳගේ පාර්ශවය විසින් කුලී පදනම මත වර්ෂ ගණනාවක සිට භාවිතා කරන ලද බවත්, රොෂානා නිස්රීන් අබුසාලී මොහොමඩ් නැමති අය විසින් මෙම ස්ථානයේ මාර්ග සංවර්ධන අධිකාරිය සමග නිර්වන්දි ගිවිසුමකට යටත්ව ගොඩනැගිලි සැලසුමක් අනුමත කරගැනීම සඳහා ඉදිරිපත් කර ඇති බවත් , ඒ අතරතුර කාලයේ මෙම ඉඩමේ පැවති ගොඩනැගිලි සහිත කොටස් ඉහත සඳහන් අය විසින් මිළදීගත් බවත් සඳහන් කර ඇත.

කොළඹ බදුල්ල මාර්ගය පුළුල්කිරීමේ දී මෙම ගොඩනැගිල්ලේ මුහුණත කඩා ඉවත් කිරීමට සිදු වූ අතර , ගොඩනැගිල්ලට වඩා මාර්ගය ඉස්සීම නිසා එම ගොඩනැගිල්ල තුළ ජීවත්වීමට නොහැකි වූ බැවින් , එම ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම සඳහා තමන් විසින් නගර සභාව වෙත ඉල්ලීම් ලිපි භාරදුන් බවත් දන්වා ඇති අතර , නිස්රීන් අබුසාලී මිය විසින් ඉදිරිපත් කරන ලද ගොඩනැගිලි අයදුම්පත මෙතෙක් අනුමතකර දී නොමැත්තේ මන්ද යන ප්‍රශ්ණය ද යොමුකර ඇත.

නිර්වන්දි ගිවිසුමට අදාළ ලියවිලි මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දී ඇතත් වසරකට වඩා ඉකුත්වීමත් එය ඉටුකර නොදීමෙන් තමාගේ මානව හිමිකම් කඩකර ඇති බව සඳහන් කර ඇත. එම තත්ත්වය යටතේ මෙම ගොඩනැගිල්ල තමා ඉදිකිරීමේ දී නගර සභාවේ සභාපතිවරයා හා වැඩ අධිකාරීවරයා විසින් එය නතර කිරීම හේතුවෙන් තමාට අලාභ සිදු වී ඇති බව දන්වා ඇත.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් , මෙම ලිපිය ඉදිරිපත් කර ඇති අය මෙහි සඳහන් කරඇති ස්ථානයට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කරනොමැති බවත් , එම ස්ථානයට රොෂානා නිස්රීන් අබුසාලී නැමැති අය විසින් ඉදිරිපත් කරන ලද ගොඩනැගිලි අයදුම්පත සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සමග නිර්වන්දි ගිවිසුමකට යටත්ව අනුමැතිය ලබාදීමට කටයුතු කර ඇති බවත් මෙතෙක් ඒ සඳහා වන නිර්වන්දි ගිවිසුමට එළඹි බවක් මෙම සභාවට දන්වා නොමැති බැවත් පැවසීය.

මෙම ස්ථානයේ ඉහත සඳහන් කරන ලද ගොඩනැගිලි සැලැස්මට ද පටහැනි වනසේ විථිරේඛාව තුළට හසුවන අන්දමින් කොන්ක්‍රීට් තට්ටුවක් යෙදීමට කටයුතු කර ඇත. මෙම ස්ථානයේ ඔහු විසින් කරන ලද අනවසර ඉදිකිරීම නතර කරන ලෙස ඔහු වෙත මෙම සභාව මගින් ලිඛිත නිවේදන යවා ඇත. එසේම මා සහ නිලධාරීන් විසින්ද විධිමත් පරිදි අනුමැතිය ලබාගන්නාතෙක් අදාළ ඉදිකිරීම් නොකරන ලෙසට උපදෙස් ලබා දී ඇත. එහෙත් පවත්නා නීති සම්බන්ධව කිසිදු තැකීමක් නොකර හිතුවක්කාර ලෙස නීතිය අතට ගෙන මෙම කාර්යය දිගින් දිගටම සිදුකල අතර , වෙනත් අයෙකුගේ නමින් ඉදිරිපත් කරන ලද ගොඩනැගිලි සැලැස්මකට මුවා වී මුළු ඉඩමම ආවරණය වන ලෙස සියළුම ගොඩනැගිලි නීති උල්ලංඝනය කරමින් මෙම ඉදිකිරීම් කටයුතු දිගින් දිගටම කරගෙන ගිය අතර , පසුගිය දිනක මෙම ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් දැමීමට කටයුතු කරන ලදී. එසේ කොන්ක්‍රීට් යොදා මෙම ඉදිකිරීම නිමකරන ලද්දේ නම් එම ඉදිකිරීම් ඉවත් කිරීමට ඉදිරියේ දී අපහසුතාවක් පැනනැගෙන අතර , එසේ ඉවත කිරීමේ දී මොහුට සිදුවන අලාභය බොහෝ සෙයින් වැඩිවන්නට ඉඩ තිබුණි. මෙම සියළු කරුණුද සැලකිල්ලට ඉහත අනවසර ඉදිකිරීම තවදුරටත් සිදුකිරීම වලක්වාලීම සඳහා මවිසින් පරිසර පොලිස් ඒකකයේ පැමිණිල්ලක් සටහන්කොට ඉදිකිරීම් නතර කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස වැඩ අධිකාරී මහතා වෙත නියම කරන ලද බැව් පැවසීය. ඒ අනුව පොලිස් නිලධාරීන්ද සමග ගොස් මෙම ඉදිකිරීම් නතර කරන ලෙස ඔහු වෙත කරන ලද නියෝගය නොසලකා මෙම ඉදිකිරීම් කටයුතු බලහත්කාරයෙන් සිදුකිරීමට ඔහු කටයුතු කර

කරන ලදී. අවසානයේ දී මෙම කාර්යය නතර කරවීමට බළන්ගොඩ පොලිස් ස්ථානයට අනුබද්ධ පරිසර පොලිස් ඒකකයේ ස්ථානාධිපතිවරයා ඇතුළු නිලධාරී කණ්ඩායමට විශාල වෙහෙසක් දරන්නට වූ අතර , පොලිස් බලය පාවිච්චි කර මෙම ඉදිකිරීම එදින නතර කරවීමට අවශ්‍ය කටයුතු කරන ලදී. මෙවැනි නීති විරෝධී ක්‍රියාවන්ට ඉඩදීම සහ නීතිය අතට ගෙන කටයුතු ක්‍රියාකිරීමට ඉඩදිය නොහැකි බවත් , නගරයේ ඉදිකිරීම් සඳහා නීතියක් පවතින අතර , එය කඩකර ඊට පටහැනි අන්දමින් මෙම ඉදිකිරීම සිදුකල නිසා එය නතර කිරීමට කටයුතු කල බැව් වැඩිදුරටත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා කථාකරමින් , ඉහත සඳහන් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා විශාල මුදලක් වැයකර ඇති අතර , එය අමතරමග නතර කිරීමෙන් ඔහුට අලාභයක් සිදුව ඇති බව අවධාරණය කර ඇති නිසා මේ කෙරෙහි සානුකම්පිතව සලකා බලා , ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට අවශ්‍ය පසුබිම සකස් කරදෙන ලෙස ඉල්ලීමක් කරන ලදී

එම ඉල්ලීම සාධාරණ බැවින් , එය අනුමත කරන බැව් ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා පැවසීය.

මේ සම්බන්ධව තවදුරටත් සලකා බැලීමෙන් පසුව , සැලසුම් කමිටු තීරණය අනුව ක්‍රියාකරන ලෙස ඔහු වෙත දැනුම් දීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:29 **වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම:**

ඉහත සඳහන් කරුණට අදාළව සබරගමුව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති සීඑල්ජී/1031 හා 2010.07.30 දිනැති ලිපිය සභාගත කරන ලදී.

විසින් 2009.12.31 දිනට අවසන් වර්ෂය සඳහා නියමිත දිනට ගිණුම් වාර්තා ඉදිරිපත් කර සතුටුදායක මතයක් ලබාගැනීම සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රශංසාව මෙම සභාව වෙත පළකර ඇති අතර , මෙම තත්ත්වය ඉදිරියට ද පවත්වාගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස දන්වා තිබිණ.

වාර්ෂික ගිණුම් වාර්තා සකස් කිරීම සඳහා දායක වූ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවට වලට ප්‍රශංසාත්මක ලිපි ඇතුළත් කිරීමට සභාව අනුමත කරන ලදී.

05:30 **ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ 2010 වසර සඳහා වූ සාමාජික මුදල්:**

ඉහත සඳහන් කරුණට අදාළව ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ ජාතික සම්බන්ධීකාරක හේමන්ති ගුණසේකර මහත්මිය විසින් එවා ඇති 2010.08.09 දිනැති ලිපිය සභාවට ඉදිරිපත කරන ලදී.

පළාත් පාලනය සවිබල ගැන්වීම සඳහා කටයුතු කරන ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ 2010 වර්ෂයේ සාමාජික මුදල ( රු.10,000/-) ගෙවන ලෙසත් , ඒ සඳහා වන මුදල ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය නමට රේඛනය කළ චෙක්පතකින ලැබීමට සලස්වන ලෙසත් ඉල්ලා තිබිණ.

පළාත් පාලන ගරු අමාත්‍යතුමන්ගේ අනුමැතියට යටත්ව රු.10000/- ක මුදලක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:31 **ආයුර්වේද කම්කරු තනතුර :**

බළන්ගොඩ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ආයුර්වේද කම්කරු තනතුර සඳහා , සේවකයෙකු බඳවා ගැනීමට අයදුම්පත් කැඳවූ අතර , එම අයදුම්පත් අතරින් බළන්ගොඩ , ඕළුගන්තොට ,අංක: 69/ඒ දරණ ලිපිනයේ පදිංචි එම්.උපුල් නිශාන්ත කුමාර මහතා සේවයේ යොදවා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී , එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව සභා සම්මත විය.

## 06. මුදල් ගෙවීම් අනුමත කිරීම ( රු.10000/- ට වැඩි ගෙවීම්)

2010.07.28 දින සිට 2010.08.10 දක්වා රු.10000/- ට වැඩි ගෙවීම් පිළිබඳ විස්තරයක් සභාවට ඉදිරිපත් කරන ලදී.

| දිනය | විස්තරය | ව.අ. | චෙක්පත් අංකය | මුදල |
|---|---|---|---|---|
| 2010.07.28 | ජෝති ස්ටෝර්ස්<br>නගර සභා කාර්යාලීය කටයුතු සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය සපයා ගැනීම වෙනුවෙන් | 94 | 192573 | 12239.50 |
| | කේ.ජී.ගෙන්ගාදරන්<br>සෞඛ්‍ය අංශය සඳහා පොහොර කවර ලබාගැනීම | 95 | 192574 | 12400.00 |
| | හර්ෂන කලර් සෙන්ටර්<br>තානායම අලුත්වැඩියාව සඳහා අවශ්‍ය තීන්ත ලබාගැනීම | 96 | 192575 | 11515.98 |
| 2010.07.29 | සභාපති, කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>කිරිදිගල රබර්වත්ත සියඹලාගහවත්ත මාර්ගය පැති බැම්ම බැඳ හියුම් පයිප්ප බෝක්කු දමා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ අවසන් ගෙවීම | 100 | 192580 | 229421.48 |
| | සභාපති, තලංගම පැරකුම් ගොවි සංවිධානය<br>සරස්වතීවත්ත පාර කනත්ත කෙළවර පහළට බසින මාර්ගය ජේ.ඩබ්.පොඩිසිංඤෝ ඇතුළු පවුල් කිහිපයකට යන මාර්ගය පඩිපෙළ සැකසීම කර්මාන්තයේ පළමු කොටස ගෙවීම | 104 | 192588 | 127286.83 |
| 2010.07.29 | කළමනාකරු, ජාතික ජලසම්පාදන මණ්ඩලය<br>2010 ජුලි මාසයේ පොදුවෙළඳසැල ජල බිල්පත පියවීම | 106 | 192589 | 18379.40 |
| | 2010 අගෝස්තු මාසය | | | |
| 2010.08.02 | එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර්<br>බැංකියවත්ත ප්‍රධාන ගේට්ටුව අසල පැරණි ගොඩනැගිල්ල සිවිලින් ගැසීමේ කර්මාන්තයට අවශ්‍ය ඉදිකිරීම් උපාංග ලබාගැනීම | 05 | 192592 | 20120.00 |
| | ටී.ඒ.ටී.එච්.තෙබුවන<br>බස්නැවතුම්පල කසල කරත්තය අලුත්වැඩියා කිරීම | 07 | 192594 | 11150.00 |
| | ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම<br>කාර්යාලය සඳහා ලාච්චු 03 වානේ කාර්යාල මේසයක් ලබාගැනීම | 08 | 192595 | 13557.60 |
| | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධසේවා සමිතිය<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය සිමෙන්ති මිටි 25 ලබාගැනීම<br>සිමෙන්ති මිටි 01 මිළ 710.00<br>මිටි 25 සඳහා 710x25 | 13 | 192598 | 17750.00 |
| 2010.08.02 | ජී.ඩබ්.ඉන්ද්‍රලාල්<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය වැලි කියුබ් 12 ලබාගැනීම | 14 | 192599 | 48000.00 |
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>බළන්ගොඩ හුණුකුඹුර පාර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | 16 | 192601 | 495408.76 |
| 2010.08.03 | එස්.එම්.අස්නා මරික්කාර්<br>බළන්ගොඩ තානායම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 17 | 192603 | 85845.00 |
| | එම්.සී.අබ්දුල් රහීම් ඇන්ඩ් බ්‍රදර්ස්<br>තානායම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 18 | 192604 | 200210.00 |
| 2010.08.06 | දේශීය ආදායම් කොමසාරිස්<br>2010 මැයි මස රඳවා ගැනීමේ බදු මුදල් දේශීය | 20 | 192606 | 68616.58 |

| | | | | |
|---|---|---|---|---|
| | ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීම | | | |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>2010 ජුනි මාසයේ දුරකථන බිල පියවීම<br>2287275/2287153/2286596/2288737/E-Mail | 23 | 192609 | 20263.65 |
| 2010.08.06 | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>2010 ජුනි මාසයේ දුරකථන බිල පියවීම ( නාගරික මන්ත්‍රීතුමන්ලාගේ )<br>2287023/3452939/2287022/<br>2287024/3452932/2288400/3452931 | 24 | 24192609 | 24783.48 |
| | බී.ගුණරත්න<br>බළන්ගොඩ නගරයේ කැළි කසල එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා 2010.07.15 සිට 2010.07.31 දක්වා සේවකයින්ට යෙදවීම | 25 | 192610 | 100583.33 |
| 2010.08.09 | තාවකාලික වැටුප් - කර්මාන්ත අංශය<br>2010 ජුලි 16-31 දක්වා කම්කරු වැටුප් ගෙවීම | 27-1 | 192612 | 58250.00 |
| 2010.08.09 | දිලුමිණි බිල්ඩර්ස්<br>කොම්පෝස්ට් භූමියේ ප්‍රධාන ගේට්ටුව අසල පැරණි ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ කර්මාන්තයට අවශ්‍ය සිමෙන්ති ගල් ලබාගැනීම | 28 | 192622 | 10800.00 |
| | සාමාන්‍යාධිකාරී - ලංකා විදුලිබල මණ්ඩලය<br>පොදු වෙළඳසැලේ 2010 ජුලි මස විදුලිබිල පියවීම | 29 | 192623 | 10068.00 |
| 2010.08.10 | නොරිටාකේ ලංකා පෝසිලේන් පුද්ගලික සමාගම<br>තානායම සඳහා අවශ්‍ය පිගන් භාණ්ඩ මිළදී ගැනීම | 33 | 192625 | 263273.71 |
| | ඩී.පත්මසිරි<br>බළන්ගොඩ තානායම් ගොඩනැගිල්ලේ පිටත හා තානායම් පාලක ගොඩනැගිල්ලේ පිටත හා ඇතුළත පේමන්ට් කපා ඔප දැමීම | 35 | 192628 | 21690.00 |
| | තාවකාලික වැටුප් කර්මාන්ත අංශය<br>2010.08.01 සිට 2010.08.10 දක්වා තානායම් වහල<br>තීන්ත ආලේප කිරීම 30625/-<br>තානායම වැට ඉදිකිරීම 31250/-<br>තානායම භාජන පිරිසිදු කිරීමේ<br>ස්ථාන ටයිල් ඇල්ලීම 4500/<br>තානායම 4500/- | 36-2 | 192629 | 70875 |
| 2010.07.29 | කළමණාකරු,ජාතික ජල සම්පාදන මණ්ඩලය,<br>බස්නැවතුම්පලේ ජලබිල පියවීම<br>2010 ජුලි මාසය | 09 | 000048 | 55156.40 |
| 2010.08.09 | කළමණාකරු, මහජන බැංකුව<br>ගි.අ.017-100-10-6351750<br>ගිණුමට ලංකා බැංකුවෙන් මුදල් මාරු කිරීම | 05 | 000049 | 1000000.00 |
| | සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය<br>බස්නැවතුම්පලේ විදුලි බිල පියවීම 2010 ජුලි මාසය | 06 | 000050 | 58220.40 |

මෙම මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් අනුමත කරන ලදී.

07. **ඇස්තමේන්තු අනුමත කිරීම :**

පහත සඳහන් ඇස්තමේන්තු සභා අනුමැතියට ඉදිරිපත් කර තිබුණි.

07:01 තානායම් පිවිසුම් අභ්‍යන්තර මාර්ගය ලීල් ස්ටෝර්ස් නිවස පසුපස ආරක්ෂක බැම්ම ඉදිකිරීම 232574.32

07:02 තානායම අභ්‍යන්තර මාර්ගයේ ඉන්ද්‍රා ජුවලරි නිවස පිටුපස ආරක්ෂක බැම්ම ඉදිකිරීම කර්මාන්තය 515050.48

ඉහත සඳහන් කර්මාන්ත සඳහා සිමෙන්ති මිටි 25 ක් , ගල් හා වැලි පමණක් ලබා දී අදාළ වෙළඳසැල් හිමිකරුවන් මගින් ශ්‍රම දායකත්වය ලබාගෙන ඉටුකරවා ගැනීම සුදුසු බැව් දන්වා තිබුණි.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

07:03 බළන්ගොඩ තානායම ප්‍රධාන ප්‍රවේශ මාර්ගයේ ආරම්භක ස්ථානය අසල බස්නැවතුම්පල ඉදිකිරීම සක්ක බැම්ම ඉදිකිරීම 46239.86

07:04 බළන්ගොඩ තානායමේ මැද මිදුල සඳහා පියසි දෙකක් ඉදිකර ගෙබිම කොටස් සඳහා ඉන්ටර්ලොකින් ගල් අතුරා සකස් කිරීම. 827514.26

ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව විසින් අනුමත කරන ලදී.

**08.1 යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ :**

නැත

**යථා පරිදි කල් දී ඇති යෝජනා :**

නැත.

## 09. ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම

### 09:01 බළන්ගොඩ මහජනපොළ වැසිකිළි පද්ධතිය,මාළුකඩ හා මුරකුටිය ඉදිකිරීමේ ලංසුපත් විවෘත කිරීම

බළන්ගොඩ මහජනපොළ වැසිකිළි පද්ධතිය,මාළුකඩ හා මුරකුටිය ඉදිකිරීමේ ලංසුපත් විවෘත කිරීම පෙ.ව.10.30 ට සිදුකරන ලදී. ලැබී ඇති ලංසුපත් පිළිබඳ විස්තර පහත දැක්වේ.

- **ව්‍යාපෘතියේ වැඩ වටිනාකම: 3796431.12 කි.**

| **ලංසුකරුගේ නම** | **ඉදිරිපත් කර ඇති ලංසු මුදල** |
|---|---|
| 01. කොඩිකාර කන්ස්ට්‍රක්ෂන් ප්‍රයිවට් ලිමිටඩ්, 217/2, ඩී.එස්.සේනානායක මාවත,කහගොල්ල,අම්බලන්තොට | රු.3678478.72 vat සමග<br>වැඩ වටිනාකම<br>රු.3284356/- |
| 02. සෑම් ඩෑම් කන්ස්ට්‍රක්ෂන් ප්‍රයිවට් ලිමිටඩ්, අංක: 88,කල්තොට පාර,බළන්ගොඩ | රු.3649041.43 |

මෙම මිළ ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමුකර තීරණයක් ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

### 09:02 පළාත් පාලන සතියට අදාළ ඡායාරූප ගැනීම සහ ඇල්බමය සකස් කිරීම

පළාත් පාලන සතියට අදාළ ඡායාරූප ගැනීම සහ ඇල්බමය සකස් කිරීම සඳහා කැඳවන ලද මිළගණන් සභාවට ඉදිරිපත් කරන ලදී.

| විස්තරය | එන්.පී.ඒ.ජී.බී.වික්‍රමසිංහ , බුලත්ගම,බළන්ගොඩ | එම්.ඒ.සුබෝධ ඉන්දික , 125/7, වැවේවත්ත,බළන්ගොඩ | **සොනික් ස්ටුඩියෝ , බාන්ස්රත්වත්ත මාවත,බළන්ගොඩ** |
|---|---|---|---|
| ඡායාරූප 01 ගෙන මුද්‍රණය කිරීම | 70.00 | 70.00 | **60.00** |
| ඡායාරූප 250 පමණ අඩංගු වන ඇල්බමය සකස් කිරීම | රු.16000.00 | 15000.00 | **11000.00** |

අවම මිළ ගණන් ඉදිරිපත්කර ඇති සොනික් ස්ටුඩියෝ ආයතනය වෙතින් අදාල කාර්යය ඉටුකරගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:03 **බළන්ගොඩ තානායම සඳහා ඇද ඇතිරිලි කොට්ට උර හා කොට්ට ලබාගැනීම**

| | සන් ටෙක්ස් | චීප්සයිඩ් | ආරාධනා ටෙක්ස්ලයිල්ස් |
|---|---|---|---|
| 54x95 ඇතිරිලි 01 | 1200/- | 1150/- | 1225/- |
| 100x100ඇද ඇතිරිලි 01 | 2000/- | 1900/- | 1950/- |
| 68x95 ඇද ඇතිරිලි | 1350/- | 1325/- | 1400/- |
| 18x27 කොට්ට | 480/- | 460/- | 475/- |
| 20x30 කොට්ට 01 | 900/- | 850/- | 950/- |
| 18x 27 කොට්ට උර 01 | 350/- | 320/- | 360/- |
| 20x30 කොට්ට උර 01 | 400/- | 375/- | 425/- |
| 60 ඇද ඇතිරිලි 01 | 475/- | 440/- | 460/- |
| 90 ඇද ඇතිරිලි 01 | 650/- | 600/- | 675/- |
| 60 ඇද ඇතිරිලි නො.01 | 650/- | 600/- | 650/- |
| සාමාන්‍ය කොට්ට උර 01 | 150/- | 120/- | 160/- |
| 23x46 තුවා 01 | 275/- | 240/- | 275/- |
| නාන තුවා 01 | 490/- | 450/- | 500/- |
| කුඩා ප්‍රමාණයේ තුවා 01 | 55/- | 45/- | 60/- |

අවම මිළ ඉදිරිපත් කර ඇති චීප් සයිඩ් ආයතනය වෙතින් අවශ්‍ය ඇද ඇතිරිලි කොට්ට උර හා කොට්ට ලබාගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:04 **තානායම මැද මිදුල සඳහා හට් ඉදිකිරීමට දැව ලබාගැනීම**

| | රෝයල් ටිම්බර් ඩීලර්ස් | කැන්ඩි ටිම්බර් ඩීලර්ස් | ෆොන්සේකා වුඩ් වර්ක්ස් | සිටි ටිම්බර් ඩිපෝර්ට් | එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස් හාඩ්වෙයාර් |
|---|---|---|---|---|---|
| 3"5" - 17 ' දිග කෙම්පස් | **5355.00** | 5474.00 | 5525.00 | 5440.00 | 5406.00 |
| 14' දිග කෙම්පස් | **4410.00** | 4508.00 | 4550.00 | 4480.00 | 4452.00 |
| 12' දිග කෙම්පස් | **3780.00** | 3864.00 | 3900.00 | 3840.00 | 3816.00 |
| 9' දිග කෙම්පස් | **2835.00** | 2898.00 | 2925.00 | 2880.00 | 2862.00 |
| 2"x5"-16' දිග කෙම්පස් | **3440.00** | 3552.00 | 3600.00 | 3540.00 | 3488.00 |
| 13" දිග කෙම්පස් | **2795.00** | 2886.00 | 2925.00 | 2860.00 | 2834.00 |
| 10' දිග කෙම්පස් | **2150.00** | 2220.00 | 2250.00 | 2200.00 | 2180.00 |
| 7' දිග කෙම්පස් | **1505.00** | 1554.00 | 1575.00 | 1540.00 | 1526.00 |
| 2"x4" -11 දිග | **1633.50** | 1716.00 | 1760.00 | 1705.00 | 1650.00 |
| 8' දිග | **1188.00** | 1248.00 | 1280.00 | 1240.00 | 1200.00 |
| 2"x2" 900 දි.අ. | **78.00** | 88.00 | 86.00 | 85.00 | 80.00 |
| ගිනි සපු ලෑලි 8. දි.අඩි | **90.00** | 97.00 | 98.00 | 95.00 | 93.00 |

අවම මිළ ඉදිරිපත්කර ඇති රෝයල් ටිම්බර් ඩීලර්ස් වෙතින් අවශ්‍ය දැව ලබාගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:05 **තානායම් මාර්ගයේ ආරම්භ කොටස බැම්ම මත ඇති වැට සඳහා ජී.අයි.බට ලබාගැනීම**

| | **ඩබ්.ජේ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස්** | එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර් | ජගත් එන්ටර්ප්‍රයිසස් | යශෝධා හාඩ්වෙයාර් | දේශානි හාඩ්වෙයාර් |
|---|---|---|---|---|---|
| 2" GI බට (පකිස්ථාන්) | **3500/-** | 3600/- | 3510/- | 3525/- | 3550/- |

අවම මිළ ඉදිරිපත් කර ඇති ඩබ්.ජේ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස් වෙතින් ලබාගැනීමට අනුමැතිය ලබාදෙන ලදී.

09:06 **තානායම මැද මිදුලේ හට් ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් අවශ්‍ය ලබාගැනීම:**

| | ෆයිරුස් හාඩ්වෙයාර් | එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර් | සේනානි හාඩ්වෙයාර් | දේශානි හාඩ්වෙයාර් |
|---|---|---|---|---|
| Liron අඩි 09 01 | 291.66 | 295.00 | 300.00 | 298.00 |
| 3" GI පයිප්ප ලෙන්ත් 01 | 6250.00 | 6300.00 | 6320.00 | 6290.00 |

අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ෆයිරුස් හාඩ්වෙයාර් වෙතින් ලබාගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

10. **යෝජනා :**

10:01 **ගරු සභාපති,ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

(අ) **බළන්ගොඩ කරවිකැටිය පෙන්තකොස්ත මාර්ගය කරවිකැටිය iii පටුමග ලෙස නම්කිරීම:**

බළන්ගොඩ කරවිකැටිය පෙන්තකොස්ත මාර්ගයට ස්ථිර නමක් නොමැතිවීම නිසා පිට ප්‍රදේශවලින් පැමිණෙන ජනතාව අපහසුතාවකට ලක්වන බැවින් , එම මාර්ගය සඳහා නමක් යෝජනා කරන ලෙස බළන්ගොඩ කරවිකැටිය ආනන්දනීය සුභසාධක සංගමය විසින් ඉල්ලීමක් කර ඇති බැවින් , බළන්ගොඩ කරවිකැටිය පෙන්තකොස්ත මාර්ගය කරවිකැටිය iii පටුමග ලෙස නම්කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව එම යෝජනාව සභා සම්මත විය.

(ආ) **බළන්ගොඩ තානායම සඳහා සෞඛ්‍ය කම්කරුවෙකු හා ගිනිනිවන රථය සඳහා රියදුරෙකු බඳවා ගැනීම**

බළන්ගොඩ තානායම සඳහා සෞඛ්‍ය කම්කරුවෙකු හා ගිනි නිවන රථය සඳහා රියදුරෙකු බඳවා ගැනීම ඉතා අත්‍යාවශ්‍ය කටයුත්තක් බැවින් , එම තනතුරු ඇතිකර අවශ්‍යතාවය සලකා බඳවා ගැනීම කඩිනමින් සිදුකිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී. මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව සභා සම්මත විය.

(ඇ) **අංක: N.D.5124 දරණ වෑන් රථය කුලියට ලබාදීම**

බළන්ගොඩ තානායමේ නේවාසික පහසුකම් ලබාගන්නා අයට අවශ්‍ය අවස්ථාවන්හි දී මෙම නගර සභාව සතු අංක: N.D.5124 දරණ වෑන් රථය කුලියට ලබාදීම සුදුසු බැව් යෝජනා කරන ලදී.

මෙම යෝජනාවට ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනා විරෝධතාව පළකළ බැවින් , යෝජනාව සභා සම්මත නොවුණි.

(ඈ) **තානායමේ මත්පැන්හල පවත්වාගෙන යාම සඳහා අත්තිකාරම් මුදලක් ලබාගැනීම**

බළන්ගොඩ තානායම සඳහා මත්පැන් අලෙවි කිරීමේ බලපත්‍රය ලබාගැනීමට කටයුතු කර ඇති බැවින් , මත්පැන් මිළදී ගැනීම සඳහා පොදු අරමුදලින් රු.200000/- ක් ද කාර්ය සාධන තරඟයට ලැබුණ මුදලින් රු.50000/- ක්ද ලබාගෙන තානායම් ගිණුමට බැරකිරීම සුදුසු බවත් එමගින් ලැබෙන ආදායමෙන් අත්තිකාරම් පියවීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ඒ අනුව එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී, ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විරෝධතාව පළකරන ලදී. එසේ වුවත් , බහුතර මන්ත්‍රීතුමන්ලාගේ එකඟත්වය ඇතිව මෙම යෝජනාව සභා සම්මත විය.

(ඉ) **1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

1952 අංකඃ 06 දරණ පළාත් පාලන ආයතන ( සම්මත අතුරු ව්‍යවස්ථා ) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිතුමා විසින් සම්පාදනය කරන ලද 1956 ජුනි 08 වැනි දින අංකඃ10939 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දා වූ පළාත් පාලන ආයතන ( සම්මත අතුරු ව්‍යවස්ථා ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 වැනි කාණ්ඩයේ සිට xxix වෙත කාණ්ඩය දක්වා වූ සියළු කොටස් බළන්ගොඩ නගර සභා බලප්‍රදේශය තුළ බලපැත්විය යුතු අතුරු ව්‍යවස්ථාව වශයෙන් පිළිගැනීමටත් , ක්‍රියාත්මක කිරීමටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

10:02 **ගරු නාගරික මන්ත්‍රී ,එම්.නිමල් කරුණාරත්න මැතිතුමාඃ**

මෙම නගර සභාව සතු ඕළුගන්තොට සුසාන භූමියට ජලය ලබාදෙන ලෙස යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව යෝජනාව සභා සම්මත විය.

**11. කාරක සභා වල වාර්තා සලකා බැලීමඃ**

11:01 227-5020 දරණ වාහනයට අළුතින් කම්පෙෂරයක් සහිත බවුසරයක් සවිකරගැනීමට ලැබී තිබූ මිළ ගණන් 2010.08.20 වන දිනැති තාක්ෂණික ඇගයීම් කමිටවට ඉදිරිපත්කොට එහි වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.එම වාර්තාවේ සඳහන් පිරිවිතරයන් ප්‍රකාරව රු.1300000/- ක මුදලකට අලුතින් බවුසර් ටැංකියක් සවිකිරීමේ සේවාව විමල් ඇග්‍රෝ ට්‍රැක්ටර්ස් පුද්ගලික සමාගම වෙතින් කරගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

11:02 2010.08.11වන දින පැවති සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු රැස්වීමේ වාර්තාව , 2010.08.18 වන දින පැවති කර්මාන්ත කමිටු රැස්වීමේ වාර්තාව හා තානායම් කමිටු රැස්වීමේ වාර්තාව සභාගත කරන ලදි.

එම වාර්තාවන් සභාව විසින් අනුමත කරන ලදී.

11:03 බළන්ගොඩ තානායම සඳහා වැය වී වියදම් සම්බන්ධ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදී. එම වාර්තාව අධ්‍යයනය කල සභාව , එය අනුමත කරන ලදී.

11:04 2010 වර්ෂයේ මාර්ග/ගොඩනැගිලි ඉදිකිරීම් නඩත්තු කිරීම් කටයුතු පිළිබඳ එක් එක කාර්තුවල සිදුකර ඇති කාර්යයන් පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

11:05 බළන්ගොඩ තානායමේහි ආහාර වට්ටෝරුවෙහි මිල දර්ශනය සභාවට ඉදිරිපත් කරන ලදී. එම මිළ දර්ශනය සභාව විසින් අනුමත කරන ලදී.

11:06 2010.08.10 දින සිට 2010.08.24 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා බළන්ගොඩ තානායමෙහි ලැබීම් හා ගෙවීම් වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| මුළු ලැබීම් | 222045.10 |
| මුළු ගෙවීම් | 125214.34 |
| මුදල් ශේෂය | 96830.76 |
| **බැංකුවේ තැන්පත් කිරීම්** | **96830.76** |

මෙම ලැබීම් හා ගෙවීම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

11:07 බළන්ගොඩ මහජන පොළ වැසිකිළි පද්ධතිය,මාළු කඩ හා මුරකුටිය ඉදිකිරීමට අදාළ ලංසු විවෘත කිරීම අංකඃ09:01 යටතේ සිදුකල අතර, ඊට අදාළ තාක්ෂණික කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

ලැබී ඇති මිළ ගණන් වලට අනුව අම්බලන්තොට,ඩී.එස්.සේනානායක මාවතේ අංකඃ 217/2 හි කොඩිකාර කන්ස්ට්‍රක්ෂන් ප්‍රයිවට් ලිමිටඩ් වෙත මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමීම සුදුසු බවට එම විසින් නිර්දේශ කර ඇත.

ඒ අනුව , ඉහත සඳහන් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති රු.3284356/- ක මුදලට මෙම ව්‍යාපෘතිය එම ආයතනය වෙත පිරිනැමීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

- තානායම සඳහා සේවකයින් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා ඇති අතර , ඊට අදාළ සම්මුඛ පරීක්ෂණය 2010.08.30 වන දින පෙ.ව.10.00 ට පැවැත්වීමට තීරණය කරන ලදී.

12. **ආදායම් - වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීම:**

2010 වර්ෂයේ ජූලි මාසයට අදාළ ආදායම් හා වියදම් පිළිබඳ වාර්තාව සභාවට ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 4023290.95 |
| වෙනත් ලැබීම් | 3175935.13 |
| **මුළු ලැබීම්** | **7199226.08** |
| පුනරාවර්ථන වියදම් | 3300259.12 |
| වෙනත් වියදම් | 11361865.06 |
| **මුළු වියදම්** | **14662124.18** |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

12:02 2010.07.01 දින සිට 2010.07.30 දින දක්වා මෙම නගර සභාව සතු වාහන සඳහා වැය වූ ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදී. අදාළ ඉන්ධන වියදම් වාර්තාව අනුමත කරන ලදී.

13. **වෙනත් කරුණු :**

13:01 **ගරු නාගරික මන්ත්‍රී , ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින් , කිරිඳිගල මකුළුමුල්ල මාර්ගයේ බෝක්කුව සකස් කරන ලෙසත් , ආනන්ද මෛත්‍රීය මාවතේ නගර සභාවට අයත් කොටසේ ජීවත්වන ජනතාව උග්‍ර ජල හිඟයකින් පෙළෙන බැවින් , ඔවුන්ට ජලය ලබාදීමේ වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස ඉල්ලීමක් කරන ලදී.

කර්මාන්ත කටයුතු සඳහා අවශ්‍ය හියුම් පයිප්ප ප්‍රමාණය ලබාගන්නා ලෙස පසුගිය වර්ෂයේ සිට ඉල්ලීම් කරනු බවත් , එකම යෝජනාව සෑම සභා වාරයකටම ඉදිරිපත් කිරීමෙන් ගරු මන්ත්‍රීවරුන් හැල්ලුවකට ලක්වන බවත්, මේ සම්බන්ධව මෙතෙක් කිසිදු අවධානයක් යොමු නොකිරීම සම්බන්ධව සිය කණගාටුව ප්‍රකාශ කරන බවත් දැන්වීය.

මෙම සභාවේ පැවැත්වෙන කමිටු රැස්වීම් වල වාර්තාවන් සභා රැස්වීම දිනයේ දී ලබාදීම නිසා ගරු මන්ත්‍රීවරුන් හට එම වාර්තාවන් නිසි ලෙස අධ්‍යයනය කිරීමට අවස්ථාවක් නොලැබෙන බැව් පැවසීය.

එම නිසා සභා රැස්වීම පැවැත්වීමට දින 03-04 කලින් එම වාර්තාවන් ගරු මන්ත්‍රීවරුන් අතට පත්කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලමින් සිය අදහස් දැක්වීම නිම කරන ලදී.

13:02 **ගරු නාගරික මන්ත්‍රී , ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා**

බළන්ගොඩ නගර සභාව වෙත පවරා ගන්නා ලද තානායම අලුත්වැඩියා කර උත්සවාකාරයෙන් ජනතා අයිතිය පැවරීම පසුගිය දා සිදුකල අතර , එම අලුත්වැඩියා කටයුතු නිසි පරිදි නිම කිරීමට මෙම නගර සභාවේ සියළු දෙනාම දායකත්වය ලබාදී ඇති නිසා ඔවුන්ගේ සේවය අගය කරමින් , එම තානායමේ දී ඔවුන්ට යම් සංග්‍රහ කරන ලෙස ඉල්ලීමක් කරන ලදී.

14. **<u>අවසානයඃ-</u>**

**<u>ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාඃ</u>**

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන්ටත්, ලේකම් මහතාටත් සිය ස්තුතිය ප්‍රකාශ කරමින්, සභාවේ වැඩ කටයුතු ප.ව. 03.00 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.